# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මීළඟ ජනාධිපතිවරණය 2015 ජනවාරි 8 දින පැවැත්වීමට නියමිත ය. ශ්‍රී ලංකාව තුළ පළමු වතාවට ජනාධිපති තනතුර දරමින් සිටින අයෙක් තුන් වන වතාවටත් එම තනතුරට පත් වීමට උත්සාහ දරයි. මෙම මැතිවරණය පැවැත්වෙන්නේ ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනෙකු හෙවත් වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ විපක්ෂ සන්ධානයේ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන අතර ය. සිය පොදු අපේක්ෂකත්වය නිවේදනය කළ 2014 නොවැම්බර් මාසය තෙක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන ලේකම්වරයා සහ රටේ සෞඛ්‍ය ඇමතිවරයා ලෙස කටයුතු කළේ මෛත්‍රීපාල සිරිසේන යි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණාත්මක පර්යේෂණ ඒකකය වන සමාජ දර්ශකය (Social Indicator - SI) 1999 ජනාධිපතිවරණයේ සිට ම මැතිවරණ මහජන මත විමසුම් පවත්වා ඇත. මැතිවරණ මහජන මත විමසුම් දේශපාලනය හා පාලනය පිළිබඳ පුරවැසි ආකල්ප ආශ්‍රිත සාධක හඳුනා ගැනීම සඳහා වූ අවස්ථාවකි. එමෙන් ම රට වර්තමානයේ මුහුණ දෙන ගැටලුවලට විසඳුම් සෙවීමේ දී ඡන්ද දායකයන් අපේක්ෂකයන්ගෙන් හා පක්ෂවලින් ඉල්ලා සිටින්නේ හා අපේක්ෂා කරන්නේ කුමක් ද යන්න ගැන සිවිල් සමාජය හා දේශපාලන පක්ෂ යන දෙපාර්ශ්වයට ම වඩා හොඳ අවබෝධයක් ලබා දෙන යන්ත්‍රණයක් ලෙස ද ප්‍රයෝජනවත් වන මෙම මත විමසුම්වලින් සිය අවශ්‍යතාවන් හා ප්‍රාර්ථනාවන් ප්‍රකාශයට පත් කිරීම සඳහා ප්‍රජාවන් බල ගැන්වීම ද සිදු වේ.

මැතිවරණ මත විමසුම් ජනප්‍රිය වීමට ප්‍රධාන හේතුව ප්‍රතිඵල පෙරදැකීමට ඇති හැකියාව යි. එහෙත් මෙම මත විමසුමේ අරමුණ වූයේ මැතිවරණ ප්‍රතිඵල පිළිබඳ අනාවැකි කීම නො ව පුරවැසියන් සැලකිලිමත් වන ගැටලු සහ මැතිවරණ ප්‍රචාරක කාල සීමාව තුළ සාකච්ඡාවට ලක් වන ප්‍රධාන මාතෘකා ගැන ඔවුන් දරන අදහස් සම්බන්ධයෙන් අපේක්ෂකයන් හා පක්ෂ දැනුවත් කිරීම යි.

# ක්‍රමවේදය

මෙම මත විමසුම ශ්‍රී ලංකා දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම පැවැත්විණ. ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොදා ගෙන ප්‍රතිචාර දක්වන්නන් 2000ක නියැදියක් සමග මුහුණට මුහුණ ලා කෙරුණු සම්මුඛ සාකච්ඡාවලින් 1999ක් ම සම්පූර්ණ සම්මුඛ සාකච්ඡා ලෙස සැලකිණ.

මෙම මත විමසුමේ දී සමාජ දර්ශක ඒකකය (Social Indicator - SI) විසින් යොදා ගත්තේ අදියර ගණනාවකින් සමන්විත අහඹු නියැදි ශිල්ප ක්‍රමයකි. නියැදියේ විශාලත්වය තීරණය කෙරුණේ මත විමසුමේ විශ්වසනීයත්වය 95%කින් ආරක්ෂා කිරීමට හා උපරිම වැරදීම් සංඛ්‍යාව 2%කට සීමා කිරීමට සහ අපේක්ෂිත විශ්ලේෂණයට අවශ්‍ය ආකාරයට දත්ත වර්ග කර ගත හැකි වන පරිදි ය. මෙලෙස ජනගහන සමානුපාතික නියැදිකරණ විධික්‍රමය (Population Proportionate Sampling - PPS) යොදා ගෙන දිවයින පුරා විසිරි ප්‍රතිචාර දක්වන්නන් 2000කගේ මත විමසන ලදී. මෙහි දී නියැදියේ ජනවාර්ගික සමානුපාතිකතාව ද සැලකිල්ලට ගැනිණ. නියැදිය පතුරුවා හැරීමේ මට්ටම ලෙස ඡන්ද කොට්ඨාස යොදා ගත් අතර ඒ ඒ ඡන්ද කොට්ඨාසයෙන් ඡන්ද මධ්‍යස්ථාන තෝරා ගත්තේ අහඹු ලෙස ය. ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානයේ ආරම්භය ලෙස 2008 ඡන්ද හිමි නාම ලේඛනය යොදා ගෙන සුරත් නීතිය සහ අවසන් උපන් දින විධික්‍රමය යොදා ගෙන ප්‍රතිචාර දක්වන්නෝ අහඹු ලෙස තෝරා ගැනුණහ.

විශ්ලේෂණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර 2012 ජන සංගණන දත්ත යොදා ගෙන දත්ත කට්ටලය බර තබන ලදී. ඉන් අපේක්ෂා කෙරුණේ සමීක්ෂණ දත්ත කට්ටලය තුළ ගැබ් වන සැබෑ භූගෝලීය හා ජනවාර්ගික සමානුපාතිකතාවන් පිළිබිඹු කිරීම යි.

# විධායක සාරාංශය

- මැතිවරණ කාල පරිච්ඡේදය වුව ද දේශපාලනය හා රජයේ කටයුතු පිළිබඳව බෙහෙවින් උනන්දු වන බව පවසන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් 14.5%කි. ඒ අතර 50%ක් පමණ තමන් තරමක උනන්දුවක් දක්වන බව ද 34%6%ක් තමන් කිසි ම උනන්දුවක් නොදක්වන බව ද පවසති.

- ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (86.9%ක්) තමන්ගේ ඡන්දයට මැතිවරණ ප්‍රතිඵලයේ වෙනසක් ඇති කළ හැකි බව විශ්වාස කරති. ඉන් 47.9%ක් ඊට දැඩි ලෙස එකඟතාව පළ කරති. මෙම එකඟතාව ඉහළ ම මට්ටමේ පවතින්නේ සිංහලයන් අතර ය (89.9%කි). එය පහළ ම මට්ටමේ පවතින්නේ දෙමළ ප්‍රජාව තුළ ය (74.6%කි).

- ශ්‍රී ලාංකිකයන් මැතිවරණ ආශ්‍රිත තොරතුරු දැන ගන්නා ප්‍රධාන මූලාශ්‍ර තුන වන්නේ රූපවාහිනිය (44.4%), ගුවන් විදුලිය (18%) හා පුවත්පත් (15.8%) ය.

- වැඩියෙන් ම නරඹන රූපවාහිනී නාළිකා තුන වන්නේ හිරු (20.1%), ස්වාධීන රූපවාහිනිය (ITN) (20%) සහ සිරස (16.8%) යි. වැඩි කැමැත්තක් දක්වන ගුවන් විදුලි නාළිකා වන්නේ හිරු එෆ්එම් (23.4%) සහ සූරියන් එෆ්එම් (13.9%) ය. වැඩියෙන් ම කියවන පුවත්පත් වන්නේ ලංකාදීප (46.8%), වීරකේසරී (13.9%) සහ දිවයින (7.6%) ය.

- මෙම මැතිවරණ ප්‍රචාරක කාලය තුළ දී ද සාකච්ඡාවට ලක් වෙමින් පවතින ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ගැටලු ලැයිස්තුවකින් ශ්‍රී ලාංකිකයන් වඩාත් ම වැදගත් යැයි සලකන ප්‍රධාන ගැටලු තුන වන්නේ ජීවන වියදම (32.2%), රැකියා අවස්ථා (12.9%) සහ අධ්‍යාපනය (9.8%) යි.

- සිංහල ප්‍රජාව වඩාත් ම වැදගත් ගැටලු තුන ලෙස සලකන්නේ ජීවන වියදම (34%), රැකියා අවස්ථා (12.4%) සහ ආරක්ෂාව (10.9%) යි. අනුපිළිවෙළින් දෙමළ, උඩරට දෙමළ හා මුස්ලිම් ප්‍රජාවන් වඩාත් ම වැදගත් ගැටලු ලෙස සලකන්නේ ජීවන වියදම, අධ්‍යාපනය හා රැකියා අවස්ථා ය.

- තම අපේක්ෂකයා තෝරා ගන්නා විට ශ්‍රී ලාංකිකයන් විසින් වැදගත් යැයි සලකන වඩාත් ම වැදගත් ගුණාංග තුන වන්නේ අපේක්ෂකයා උගතෙකු වීම, ඔවුන් දූෂිතයන් නොවීම සහ ඔවුන්ගේ නායකත්ව ගුණාංග යි.

- 2015 ජනාධිපතිවරණය නිදහස් හා සාධාරණ මැතිවරණයක් වෙතැයි බලාපොරොත්තු තබා සිටින ශ්‍රී ලාංකිකයන්ගෙන් 40.3%ක් එය නිදහස් හා සාධාරණ මැතිවරණයක් වන බව පවසන අතර 21.5%ක් 21.5%ක් එය නිදහස් හා සාධාරණ වීමට ඉඩ තිබෙන බව පවසති. එය නිදහස් හා සාධාරණ නොවනු ඇති බව පවසන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් 12.7%ක් පමණකි. ඒ අතර 25.6%ක් පවසන්නේ ඒ ගැන තමන් නොදන්නා බව යි.

- ශ්‍රී ලාංකිකයන්ගෙන් 50ක්% පමණ මේ අවස්ථාවේ දී මැතිවරණයක් අවශ්‍ය බව විශ්වාස කරන අතර 29.7%ක් සිතන්නේ එය අනවශ්‍ය බව යි. ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතර ගත් විට උඩරට දෙමළ ප්‍රජාවෙන් 67.5%ක් ද මුස්ලිම් ප්‍රජාවෙන් 62.5%ක් ද සිංහල ප්‍රජාවෙන් 47.1%ක් ද දෙමළ ප්‍රජාවෙන් 46%ක් ද සිතන්නේ ජනාධිපතිවරණයක් අවශ්‍ය බව යි.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනාධිපතිවරයෙකුගේ ජනප්‍රියත්වය නො තකා ඔහු හෝ ඇය එම තනතුර දරන කාල සීමා ගණන උපරිම වශයෙන් දෙකකට සීමා කළ යුතු දැයි විමසූ විට ශ්‍රී ලාංකිකයන්ගෙන් 48.4%ක් එය කාල සීමා දෙකකට සීමා කළ යුතු බවට එකඟ වූ අතර 24.8%ක් ඉන් 24.8%ක් තමන් ඊට දැඩි ලෙස එකඟ වන බව පවසති.

- මුස්ලිම් ප්‍රජාවේ බහුතරය (70.1%ක්) එය කාල සීමා දෙකකට සීමා කළ යුතු යැයි එකඟතාව පළ කරන අතර ඉන් 50%ක් පමණ ඊට දැඩි එකඟතාව පළ කරති. ජනාධිපතිවරයෙකුගේ සේවය උපරිම වශයෙන් කාල සීමා දෙකකට සීමා කළ යුතු බවට එකඟ වන්නේ සිංහල ප්‍රජාවෙන් 43.6%ක් පමණකි.

- ශ්‍රී ලාංකිකයන්ගෙන් 39.9%ක් ශ්‍රී ලංකාව තුළ විධියක ජනාධිපතිත්වය අහෝසි කිරීමට පක්ෂව සිටින අතර 30.9%ක් තමන් ඒ ගැන නොදන්නා බව ද 29.3%ක් තමන් ඊට විරුද්ධ බව ද පැවසූහ.

- විධායක ජනාධිපතිත්වය අහෝසි කිරීමට වැඩියෙන් ම විරුද්ධත්වය පළ කරන්නේ සිංහල ප්‍රජාව යි. ඔවුන්ගෙන් 35.6%ක් ඊට විරුද්ධ බව පැවසූ අතර දෙමළ ප්‍රජාවෙන් 8.4%ක්, උඩරට දෙමළ ප්‍රජාවෙන් 14.3%ක් සහ මුස්ලිම් ප්‍රජාවෙන් 9.2%ක් පමණක් එම මතය දැරූහ.

- පළාත් අනුව ගත් විට විධායක ජනාධිපතිත්වය අහෝසි කිරීමට ඉහළ ම සහාය දක්වන්නේ නැගෙනහිර (60.1%) සහ උතුරු (57.1%) පළාත් ය. විධායක ජනාධිපතිත්වය අහෝසි කිරීමට වැඩි ම විරුද්ධත්වය පළ කරන්නේ සබරගමුව (53.1%) සහ බස්නාහිර (36.9%) පළාත් ය.

*සැඳහුම: මෙම වාර්තාව කියවන විට එළඹෙන මැතිවරණයට හෝ සාකච්ඡාවට ලක් වෙමින් පවතින විධායක ජනාධිපතිත්වය අහෝසි කිරීම වැනි ගැටලුවලට අදාළව වැඩි දෙනෙකු 'නො දනිමි/සහතිකව කිව නොහැකි ය' යන පිළිතුර සපයා තිබෙන බව සැලකිල්ලට ගත යුතු ය.*

සම්පූර්ණ වාර්තාව - http://www.cpalanka.org/presidential-election-2015-pre-election-opinion-poll-top-line-report/